පුවතකට සෘජුව අදාළ නොවන අවස්ථාවකදී, යම් අයෙකුගේ වාර්ගිකත්වය සඳහන් කිරීම අවශ්‍ය වන්නේ කෙසේද යන්න පාඨකයින් විසින් මාධ්‍යයෙන් ඇසිය යුතු පැනයකි.

යම් කිසි පුවතකට සෘජුව අදාළ නොවන අවස්ථාවක යම් කිසි අයෙකුගේ හෝ කණ්ඩායමකගේ වාර්ගිකත්වය ඉදිරිපත් නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ සඳහන් වේ. සෘණාත්මක සන්දර්භයන් තුළ එසේ පුවතකට අදාළ නොවන විටක වාර්ගිකත්වය සඳහන් කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික වීමට ඇති හැකියාව ඊට හේතුවයි.

මෙයට කදිම උදාහරණයක් වන්නේ, නාරාහේන්පිට පෞද්ගලික රෝහලෙන් හසුවූ බෝම්බය පිළිබඳ පුවත වාර්තා කරනා මව්බිම පුවත්පත (09/16) ඒ සම්බන්ධව අත්අඩංගුවට ගත් සැකකරු "දමිළ" ජාතිකයෙකු යැයි සඳහන් කිරීමයි. කෙසේ වෙතත්, මව්බිම පුවත්පතේම සහෝදර ඉංග්‍රීසි පුවත්පත වන Ceylon Today විසින් එදිනම (09/16) මෙම පුවත වාර්තා කරයි. නමුත්, Ceylon Today එහිදී සැකකරුගේ වාර්ගිකත්වයක් සඳහන් නොකරයි!

මේ අනුව ගත් විට, එකම පුවත්පත් සමාගමක සිංහල පුවත්පත වන මව්බිම මාධ්‍ය ආචාර ධර්මයක් උල්ලංඝනය කරමින් පුවතක් ඉදිරිපත් කරන විට, එම සමාගමේම ඉංග්‍රීසි පුවත්පත විසින් එම පුවතම, ආචාර් ධර්ම උල්ලංඝනය කිරීමකින් තොරව ඉදිරිපත් කරයි. මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #CeylonToday**